**පොල් වගාකිරීමේ මණ්ඩලය - 2021**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 ව්‍යාචනය කළ මතය

පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය **ව්‍යාචනය** සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 ව්‍යාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය **ව්‍යාචනය** කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ **ව්‍යාචනය** කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 24 (අ) ඡේදය ප්‍රකාරව අස්ථිත්වයන් විසින් අයවැයගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යාවන් වෙන වෙනම නිරූපණය වන පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයයේ මූල්‍ය ප්‍රකාශනවල අයවැය ගත සංඛ්‍යාවන් දක්වා නොතිබුණි. | 2022.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන තුළ අයවැය ගත සංඛ්‍යා සමඟ සංසන්දනය වන ආකාරයට ඉදිරිපත් කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව අයවැයගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යා සහිතව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 76 (ඇ) ඡේදය ප්‍රකාර ජංගම වත්කම් යටතේ දැක්විය යුතු 2021 දෙසැම්බර් 31 දිනට මාස 06න් කල් පිරෙන රු.14,083,793 ක ස්ථාවර තැන්පතු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ දිගුකාලීන ආයෝජන ලෙස දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී කෙටිකාලීන සහ දිගු කාලීන ස්ථාවර තැන්පතු කල්පිරෙන දිනයන් අනුව වර්ග කර නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කරනු ඇත. | මාස 06 න් කල් පිරෙන ස්ථාවර තැන්පතු මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ දැක්විය යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 2 හි 9 ඡේදයට පටහැනිව පොල් වගාකිරීමේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2021 දෙසැම්බර් 31 දිනට මාස 03න් කල් පිරෙන එකතුව රු.79,826,734ක කෙටි කාලීන ස්ථාවර තැන්පතු හා රු.1,119,430,841ක ඉතුරු කිරීමේ ගිණුම් ශේෂ මුදල් සහ මුදල් හා මුදල් සමාන දෑ යටතේ පෙන්වීම වෙනුවට ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී කෙටිකාලීන සහ දිගු කාලීන ස්ථාවර තැන්පතු කල්පිරෙන දිනයන් අනුව වර්ග කර නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කරනු ඇත. | කෙටිකාලීන ස්ථාවර තැන්පතු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ යටතේ දැක්විය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 2 ට පටහැනිව මණ්ඩලයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ලාභයට සිදුකරන ගැලපීම් තුළ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනයේ ඇතුළත් රු.28,859,978 ක පෙර වර්ෂයේ ගැළපීමක් ද සිදුකර තිබුණි. | 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන පොල් වගාකිරීමේ මණ්ඩලයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී පෙර වර්ෂයට අදාළ ගැලපිලි ශේෂ පත්‍රයේ වත්කම් හා වගකීම් වලට සෘජුවම බලපාන බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයටද එම ගැළපුම් සටහන් යෙදිය යුතුය. | පෙර වර්ෂයට අදාළ ගැළපීම් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය තුළ ගැළපිය යුතුය. |
| (ඉ) 2021 වර්ෂයේදී ගෙවූ විගණන ගාස්තුව රු.552,600ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු.1,611,000 ක් ලෙස රු.1,058,400 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2021.12.31 දිනට විගණන ගාස්තු වෙන්කිරීමේ ගිණුමට ගළපා තිබූ රු.1,058,400 ක පෙර වර්ෂයේ ගැළපීම මෙම වර්ෂයේ ගෙවන ලද විගණන ගාස්තු ලෙස සටහන් වී ඇත. | පෙර වර්ෂයට අදාළ ගැළපීම් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය තුළ ගැළපීම් සිදුකළ යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂයේදී මුදලින් මිලදීගත් දේපළ පිරියත හා උපකරණවල වටිනාකම රු.117,397,591 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දී එම අගය රු.111,506,381 ක් ලෙස සටහන් කර තිබුණු බැවින් ආයෝජන ක්‍රියාකරකම් තුළින් ලද මුදල් ප්‍රවාහය රු.5,891,210 කින් වැඩි වී තිබුණි. | 2021 වර්ෂයට අදාළ දේපළ පිරියත හා ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීමට රු.117,397,591 ක් වියදම් කර ඇති අතර මුදල් වත්කම් වලට අදාළ වැරදි නිවැරදි කිරීමේ ශේෂයන් හා වත්කම් අපහරණයට අදාළ ශේෂයන්හි එකතුව රු.5,891,209 ක් එම ගිණුමට ගලපා අවසාන ශේෂය රු.111,506,381 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කර ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ මුදලින් මිලදී ගත් වත්කම්හි නිවැරදි අගය දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (උ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහයන්ට අදාළව කාරක ප්‍රාග්ධනය ගැළපීම් සිදු කිරීමේදී තොග අගයන්හි වෙනස රු.503,251,200 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු.502,090,934 ක් ලෙස රු.1,160,266 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ පොල් පැළ, පොල් ආශ්‍රිත වෙනත් වටිනාකම් දෙක අතර ගළපන ලද ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන ගැළපීමේ තොග වෙනස්වීම නිවැරදිව සටහන් කළ යුතුය. |
| (ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කමක අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සම්පූර්ණයෙන් ක්ෂයකර තිබුණු පිරිවැය රු.424,474,271 ක් වූ වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනද ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 ප්‍රකාරව ගැලපුම් කර ගිණුම් ගතකර නොතිබුණි. | පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් සියලුම ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට ලබා දී ඇත. එම කාර්යය අවසන් වූ වහාම මෙම ප්‍රත්‍යාගණිත වටිනාකම මූල්‍ය ප්‍රකාශනය තුළ ගැළපීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ප්‍රයෝජනයට ගනිමින් පවතින වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කර ඇස්තමේන්තුගත වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

| | | |
|---|---|---|
| (එ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 හි 12 ඡේදයට අනුව ලැබෙන සියලු ආදායම්, අයභාරය ලෙස හඳුනා ගත යුතු වුවත් 2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.734,294,000 ක ප්‍රාග්ධන ප්‍රදානය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ රු.679,002,363 ක් ලෙස රු.55,291,637 ක් අඩුවෙන් ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි. | 2021.12.31 දිනට පොල් වගාකිරීමේ මණ්ඩලයට භාණ්ඩාගාර ප්‍රතිපාදන ලෙස රු.734,294,000 ක් ලැබී ඇත. එම මුදලින් රු.55,291,637 ක් භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ඇස්තමේන්තුගත කර තිබූ ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා වැයකර ඇත. ඒ අනුව ඉතිරි රු.679,002,363 ක් සංවර්ධන ව්‍යාපෘති සඳහා වූ මුදල් ආදායම් ලෙසද රු.55,291,637 ක් ප්‍රාග්ධන ආයෝජන ලෙසද ගිණුම් තබා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල සඳහන් ආකාරයට භාණ්ඩාගාර ප්‍රදාන මූල්‍ය ප්‍රකාශනයේ දැක්විය යුතුය. |
| (ඒ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 18 හි 2 වන ඡේදය ප්‍රකාරව ජෛව වත්කම් සහ අස්වනු නෙළන අවස්ථාවේදී වන කෘෂිකාර්මික නිෂ්පාදන මෙම ප්‍රමිතිය යටතේ ජෛව වත්කම් ලෙස හඳුනාගත හැකි වුවත් 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ නිරූපණය කර ඇති රු.365,711,768ක ජීව විද්‍යාත්මක වත්කම් වටිනාකම තුළ ඊට අදාළ නොවන සම්පූර්ණයෙන්ම අක්‍රියව පවතින ජීව වායු ව්‍යාපෘතියට අදාළ රු.300,374 ක පිරිවැය හා පලෙයි ඉඩම් සංවර්ධන වැඩසටහන සඳහා දරන ලද රු.74,610,392 ක වටිනාකම ද ඇතුළත් කර තිබුණි. | ජීව විද්‍යාත්මක වටිනාකම යටතේ දක්වා ඇති ජීව වායු ව්‍යාපෘතිය මේ වන විට සම්පූර්ණයෙන් අකර්මන්‍යව පවතින අතර ඊට අදාළ රු.300,374 ක වටිනාකම ඉදිරි වර්ෂයේදී ලියා හැරීමට කටයුතු කරනු ලැබේ. එසේම ජීව විද්‍යාත්මක වත්කම යටතේ පෙන්වා ඇති පලෙයි ඉඩම් සංවර්ධන පිරිවැය රු.74,610,392.00 ක වටිනාකම 2022 මූල්‍ය ප්‍රකාශන තුළ ජීව විද්‍යාත්මක වත්කම් සටහනින් ඉවත් කර වෙනත් සංවර්ධන වැඩසටහන් යටතේ දැක්වීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 18 ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම්වලට අදාළ අයිතම පමණක් ජෛව වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඔ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 18 හි 13 වන ඡේදය අනුව ජීව විද්‍යාත්මක වත්කමක් ලෙස හඳුනා ගත හැකි ආදර්ශ උයන් 12 හි කොස්, තේක්ක ආදී වර්ග 51ක දැවමය වටිනාකමක් සහිත ගස් 8,916ක් හා තවාන් 39 හි වර්ග 64ක දැවමය වටිනාකමක් සහිත ගස් 6,577ක් වශයෙන් එකතුව ගස් 15,493ක් ද ආදර්ශ පොල් උයන් 12 හි පොල් ගස් 128,601ක් සහ තවාන් 39ක පොල් ගස් 8,473ක් ලෙස එකතුව පොල් ගස් 137,074ක් ද භෞතික සමීක්ෂණයෙන් හඳුනාගෙන තිබුණද එම ගස්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශ පොල් උයන්වල ජීව විද්‍යාත්මක වත්කමක් ලෙස හඳුනාගෙන ඇති දැවමය වටිනාකමක් ඇති සියලුම ගස් වර්ගවල වටිනාකම තක්සේරු කිරීම සඳහා මේ වන විට ජාතික වැවිලි කළමනාකරණ ආයතනයට භාර දී ඇත. එම වාර්තාව ලැබුණු පසු එම දැවමය වටිනාකම සහිත සියලුම ගස් වර්ගවල තක්සේරු අගය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 හි 13 වන ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවල ගැළපීම් කිරීමට කටයුතු කරනු ඇත. | ජීව විද්‍යාත්මක වත්කම්වල තක්සේරු වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය හා ආදර්ශ පොල් උයන් අතර සිදු වන ගනුදෙනු වෙනුවෙන් පවත්වාගෙනයන අන්තර් ජංගම ගිණුම්වල වර්ෂ ගණනාවක සිට තුලනය නොවූ ශේෂ ඉදිරියට ගෙන එමින් පැවති අතර ඒ අනුව නිරවුල් නොවූ ගනුදෙනු හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ ආදර්ශ පොල් උයන් 06 ක එකතුව රු.31,348,289ක හර ශේෂයක්ද, පොල් උයන් 06 ක එකතුව රු.50,374,300ක බැර ශේෂයක් ද පැවති අතර එම හර හා බැර ශේෂයන් එකිනෙකට හිලව් කිරීමෙන් අනතුරුව ආදර්ශ පොල් උයන්වලට ගෙවිය යුතු රු.19,026,011ක් ජංගම වත්කම් යටතේ බැර ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණි. | ඉදිරියේදි ආදර්ශ පොල් උයන් ජංගම ගිණුමේ පවතින ශේෂය පිළිබඳ වෙනසට හේතු හඳුනාගෙන නිවැරදි කිරිමට කටයුතු කරනු ඇත. | අන්තර් ජංගම ගිණුම්වල ශේෂයන් නිවැරදිව තුළනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් තවාන් 39 කට ප්‍රධාන කාර්යාලය විසින් ප්‍රාදේශීය කාර්යාල හරහා මාසිකව ලබාදෙන මුදල්වලින් එම තවාන්වල සියලු දෛනික වියදම් දැරීමෙන් අනතුරුව වර්ෂය අවසානයේදී ඉතිරි මුදල් ප්‍රධාන කාර්යාලයට ආපසු යැවීමෙන් පසුව තවාන් ලෙජර ගිණුම තුළනය නොවීම නිසා වසර ගණනාවක සිටම තවාන් ලෙජර ගිණුමෙහි ඉදිරියට ගෙන ආ හර හා බැර ශේෂයන් පැවති අතර 2021 වර්ෂය අවසානයට එම හර හා බැර ශේෂවල වෙනස රු.4,675,275 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | තවාන් ගිණුම් තුළනය කර ගිණුම් තැබීමට ඉදිරියේදි කටයුතු කරනු ඇත. | වෙනස්කම් සඳහා හේතු හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ගැළපීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය විසින් මීගමුව බීජ පොල් ඒකකය වෙත බීජ පොල් ප්‍රවාහනය, බීජ පොල් ඒකකයේ ඉන්ධන වියදම්,වාහන නඩත්තු වියදම් ආදී දෛනික වියදම් දැරීම සඳහා ලබා දෙන මුදල් වර්ෂය අවසානයේ තුළනය කර ගැනීමෙන් තොරව, සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.1,703,686ක හර ශේෂයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | ශේෂය තුළ ස්ථාවර වත්කම් වලට අදාළ ශේෂයක් නොමැති බැවින් 2022.12.31 දිනට පෙර වර්ෂය ගැලපුම් ගිණුමට ගළපා නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | වෙනස්කම් සඳහා හේතු හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ අදාළ ශේෂ නිවැරදිව ගැළපීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) මණ්ඩලයට අයිති මාතර වැලිගම පිහිටි අක්කර 15 ක ඉඩමක් “පොල් කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගයට ඔරොත්තුදෙන ප්‍රතිරෝධී බීජ උද්‍යානයක් ” ඉදිකිරීම සඳහා පොල් පර්යේෂණ ආයතනයට බදු දී තිබුණි. ඒ සඳහා 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ලැබිය යුතු බදු කුලිය එකතුව රු.1,125,000 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අය වී නොතිබුණු අතර ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කිරීමද සිදු කර නොතිබුණි. | 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා පොල් පර්යේෂණ ආයතනයෙන් ලැබිය යුතු රු.1,125,000 ක මුදල 2022.12.31 දිනට ලැබිය යුතු මුදල් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇත. එසේම එම මුදල් පොල් වගාකිරීමේ මණ්ඩලයට ලබා ගැනීමටද කටයුතු කර ඇත. | බදු මුදල් නිසි පරිදි අයකර ගැනීමට හා අයවිය යුතු ශේෂ නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) පාසිකුඩා සංචාරක ව්‍යාපෘතියට අදාළව පසුගිය වර්ෂයන්හි දරන ලද රු.22,197,339ක පුනරාවර්තන වියදම ආදර්ශ පොල් උයන් යටතේ දිගුකාලීන ආයෝජන ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් දිගුකාලීන ආයෝජන වටිනාකම එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | පාසිකුඩා සංචාරක ව්‍යාපෘති තුළ හඳුනාගත හැකි ස්ථාවර වත්කම් නොමැති බැවින් මෙම වටිනාකම 2022.12.31 දිනට පෙර වර්ෂයට ගළපා නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ආයෝජන වටිනාකමින් එම වියදම් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) 2021 වර්ෂය සඳහා කප්රුක ව්‍යාපෘතියේ ආයෝජනයන් මත ලැබුණු ස්ථාවර තැන්පතු පොලී රු.1,996,293 ක් සහ 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී රු.546,630ක් වශයෙන් මුළු පොලී ආදායම රු.2,542,923 ක් වුවද කප්රුක ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල පොලී ආදායම රු.2,988,370 ක් ලෙස දක්වා ඇති බැවින් පොලී ආදායම රු.445,447 කින් වැඩිපුර ගිණුම්ගත වී තිබුණි. | 2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා කප්රුක ණය යෝජනා ක්‍රමයේ ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.445,447 ක මුදල් වැඩිපුර ලැබීම පෙර වර්ෂයේ ගැළපුම් ලෙස සඳහන් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ලද පොලී ආදායමක් ලෙස ගිණුම්ගත වී ඇත. | වාර්ෂික පොලී ආදායම නිවැරදිව ගණනය කර ගිණුම් ගත කළ යුතුය. |
| (උ) පන්නල ප්‍රාදේශීය ලේකම් විසින් අක්කර 331 රූඩ් 01 ක් වූ මහයාය වත්ත ඉඩම 1993 ජූලි 21 දින ආයතනය වෙත පවරා දී තිබුණු අතර එහි වටිනාකම රු.7,813,048 ක් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලද පෙන්වා තිබුණි. ඒ අනුව පර්. 01ක වටිනාකම රු.147ක් වැනි අඩු අගයක් ගත්තද සමාලෝචිත වර්ෂය අවසානය තෙක් ඉඩමේ නිවැරදි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මහයාය වත්තට අයත් ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් අනතුරුව ප්‍රත්‍යාගණිත වටිනාකම ඉදිරි මූල්‍ය ප්‍රකාශන තුළ ගැළපීමට කටයුතු කරනු ඇත. | ඉඩම්වල වටිනාකම් නිවැරදිව තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආදායම්) ගේ 2021 මැයි 20 දිනැති ලිපිය පරිදි 1974 සිට 2022 වර්ෂය දක්වා මඩකලපුව, පාසිකුඩා වත්ත, කුරුණෑගල හාවානීල වත්ත හා ගර්ට්ලන්ඩ් වත්ත යන පොල් උයන් 3ක පරිහරණ ගාස්තු ලෙස රු.156,928,599 ක් එම සභාවට ගෙවිය | පොල් උයන් 3ක පරිහරණ ගාස්තු සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, භාණ්ඩාගාරය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කිරීමෙන් පසු ලැබෙන තීරණ අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමඟ ඇතිකර ගත් ගිවිසුම් ප්‍රකාරව ගෙවිය යුතු පරිහරණ ගාස්තු ගෙවීම් කිරීමට හා මූල්‍ය ප්‍රකාශනවල අදාළ |

| | | |
|---|---|---|
| යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අදාළ ගෙවීම් සිදුකර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වෙන් කිරීමක් හෝ හෙළිදරව් කිරීමක්ද සිදුකර නොතිබුණි. | පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් ගෙවිය යුතු වටිනාකම් පිළිබඳ ඉදිරි මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | වෙන්කිරීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (එ) සමාලෝචිත වර්ෂයේ පොල් වගාකිරීමේ මණ්ඩලයේ පොල් අලෙවි ආදායම රු.2,095,743 කින් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණු අතර ලේනව ආදර්ශ පොල් උයනේ ලැබිය යුතු පොල් වෙන්දේසි ආදායම වූ රු.134,313 ක් දෙවරක් ආදායමට එකතු වී තිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට පොල් අලෙවියෙන් ලැබිය යුතු ණයගැති ගිණුමේ අඩුවෙන් දක්වා ඇති රු.2,095,743 ශේෂය, අතපසුවීමකින් 2022 වර්ෂයේ පොල් ආදායම ලෙස ගිණුම්ගත වී ඇති අතර, 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු සිදු කර ඇත.<br>තවද, ලේනව ආදර්ශ පොල් උයනේ ලැබිය යුතු පොල් වෙන්දේසි ආදායම වන රු.134,313 වටිනාකම දෙවරක් ආදායමට එකතුවීම 2022.12.31 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු සිදු කර ඇත. | ආදායම නිවැරදිව ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඒ) ආදර්ශ පොල් උයන්හි ලාභය රු.242,987,320 ක් වුවද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ එම අගය රු.242,835,000 ක් ලෙස සටහන් වීම නිසා වර්ෂයේ ආදායම රු.152,320 කින් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | මෙය ගණිත කර්ම දෝෂයක් වන අතර උප ලේඛනයේ ශේෂය නිවැරදිව දක්වා ඇත. | ආදර්ශ පොල් උයන්හි ලාභය ආදායම් ප්‍රකාශයේ නිවැරදිව සටහන් කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල<br>**රු.** | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) මහනුවර පත්තිනි දේවාලයට අයත් බදු ඔප්පුවක් මඟින් මණ්ඩලයට පවරා දී තිබුණු අක්කර 121 රූඩ් 01 පර්.07 ක රන්දෙණිය වත්තේ හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ලේනව වත්තේ රු.1,255,020 ක මැනුම් ගාස්තු වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණු නමුත් | 1,255,020 | ඉඩමේ සැලැස්ම | රන්දෙණිය වත්ත හා ලේනව වත්ත සඳහා අයිතිය තහවුරු කිරීම පිළිබඳ තොරතුරු සොයා බලා ඉදිරියේදී අදාළ ගැලපීම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය අනුව ගැලපීමට අවශ්‍ය කටයුතු කරනු ඇත. | අදාළ ඉඩම්වල සැලසුම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| එම වටිනාකම සනාථ කිරීමට අවශ්‍ය ඉඩමේ සැලැස්ම විගණනයට ඉදිරිපත් නොවීය. | | | | |
| (ආ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණයගැති ගිණුම් 17කට අදාළ රු.55,783,581ක ශේෂ සඳහා ශේෂ සනාථ කිරීම් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 55,783,581 | ශේෂ සනාථ කිරීම් | 2021 වර්ෂයට අදාළව ණයගැති ශේෂයන් සම්බන්ධයෙන් ලිපි යවා ඇති නමුත් පිළිතුරු ලැබී නැත. | ශේෂ සනාථන මඟින් ණයගැති ශේෂවල භෞතික පැවැත්ම තහවුරු කළ යුතුය. |
| (ඇ) 2021 මැයි මස 13 දින සිට දෙසැම්බර් 23 දක්වා අවස්ථා 33 කදී පොල් වගාකිරීමේ මණ්ඩලය පොල් සංවර්ධන අධිකාරියේ පොල් අලෙවි කිරිමේ වෙන්දේසියට පොල් වතු 8ක පොල් ගෙඩි 2,588,795ක් ඉදිරිපත්කර, ගැනුම්කරුවන් 6ක් වෙත රු.146,437,679 ක් වටිනා පොල් අලෙවියක් සිදු කර තිබුණි. එහිදී ලොට් අංක, මුර අංක, ඒකක මිල, මුළු වටිනාකම, දඩ මුදල් හෝ වෙනත් අඩුකිරීම් පිළිබඳව ගැනුම්කරුවා දැනුවත් කරන ඉන්වොයිසියක් නිකුත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී අදාළ ගැනුම්කරුවන් වෙත ඉන්වොයිස් නිකුත් කර නොතිබුණි. | 146,437,679 | විකුණුම් ඉන්වොයිස් | එක් එක් තොගයන් සඳහා ගැණුම්කරුවන් විසින් 100%ක වටිනාකම ගෙවා ඇති අතර මුදල්භාර ගැනීමේ කුවිතාන්සි නිකුත් කර ඇත. ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන අංශය වෙතින් පොල් නිකුත් කිරීමේ නිවේදන පත්‍ර නිකුත් කර ඇත. තවද වෙන්දේසි නීතිමාලාව යටතේ පොල් ඉවත් කර ගත් පසු එක් එක් තොග සඳහා වවුචර් සකස්කර, සියලුම දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇති අතර, ඒ පිළිබඳව අදාළ බ්‍රෝකර් සමාගම ලිඛිතව දැනුවත් කිරීමට කටයුතු කරනු ඇත. | පොල් වෙන්දේසියේදී සිදුකරන විකුණුම් සඳහා අදාළ ගැනුම්කරුවන් විසින් මිලදී ගන්නා පොල් තොගයේ විස්තර ඇතුළත් ඉන්වොයිසි නිකුත් කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

(අ) හිටපු සාමාන්‍යාධිකාරීවරිය වෙත 2020 හා 2021 නොවැම්බර් මාසයේදී නොපමාව මෙම මුදල

| | | |
|---|---|---|
| 2021 වර්ෂයේදී වැඩිපුර ගෙවන ලද වැටුප් එකතුව රු.113,216 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකරගෙන නොතිබුණි. | ස්ථාන මාරු ලබා වෙනත් ආයතනයකට යාමේදී සිදු වූ ගනුදෙනුවක් නිසා ආයතන අතර ඇති වී ඇති පරස්පරතාවයකි. ඒ අනුව මෙම මුදල් එම සාමාන්‍යාධිකාරිට වැඩිපුර ගෙවා නොමැති බවත්, එම ආයතනයෙන් පොල් වගාකිරීමේ මණ්ඩලයට ලැබිය යුතු මුදලක්ය. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2013 හා 2014 වර්ෂයන්හි පැවැත්වූ වැලිගම රෝග ව්‍යාප්ති වැඩසටහන හා කාබනික පොහොර වැඩසටහන සඳහා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.6,573,572ක් ද 2014 වර්ෂයේ ලංකා සතොසට පොල් විකිණීමෙන් ලැබිය යුතු රු.302,288ක් ද ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු රු.372,537ක් ද වශයෙන් එකතුව රු.7,248,397ක් වසර 07කට වඩා වැඩි කාලයක සිට අයකර අයකරගෙන නොතිබුණි. | 2023.03.17 දින වැවිලි අමාත්‍යාංශයේ පවත්වන ලද ණය ශේෂ නිරවුල් කිරීමේ කමිටුවේදී තීරණය කරන ලද පරිදි වැලිගම රෝග මර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් පොල් වගාකිරීමේ මණ්ඩලයට ලැබිය යුතු රු.5,979,174ක් හා රු.594,398ක මුදලක් ලබා ගැනීමේ හැකියාවක් මේ වන විට නොමැති බැවින් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය යටතේ ඉදිරි මූල්‍ය ප්‍රකාශ වලින් ලියා හැරීමට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත යොමු කිරීමට පෙර මෙය විගණන හා කළමනාකරණ කමිටුව වෙත යොමු කරන ලෙසට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපදෙස් ලබා දී ඇත. | අමාත්‍යාංශය, ලංකා සතොස හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් අයවීමට ඇති මුදල් අයකර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් යෙදිය යුතුය. |
| (ඇ) සේවය හැරගිය සේවකයින් 100 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,654,349ක ණය මුදලක් වසර 02 ත් වසර 11 ත් අතර කාලයක සිට හිඟහිට තිබුණු අතර එම ණය අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියද ලබා ගැනීමෙන් අනතුරුව සේවය හැර ගිය සේවකයින්ගේ අයකළ හැකි ශේෂය අයකර ගැනීමටත් අයකළ නොහැකි වසර 2ට වඩා පැරණි හිඟ ශේෂ මූල්‍ය ප්‍රකාශ තුලින් ලියා හැරීමට කටයුතු කරනු ඇත. | මණ්ඩලයට ලැබිය යුතු මුදල් අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) 1997 හා 1999 වර්ෂයන්හි මණ්ඩලයේ පොල් මිලදී ගත් පෞද්ගලික සමාගම් දෙකකින් අයවිය යුතු රු.3,808,156 ක් අය කර ගැනීමට නඩු පවරා තිබුණු නමුත් එම නඩු නිසි පරිදි මෙහෙයවා නොතිබීමෙන් වසර 23 ක් හා 24 ක කාලයක සිට එම මුදල් අය කර ගැනීමට නොහැකි වී තිබුණි. මෙයින් රු.2,631,781 ක | මෙම සමාගම 2021 වර්ෂයේ අවසානය දක්වා පොල් සංවර්ධන අධිකාරිය හරහා තම ව්‍යාපාරික කටයුතු සිදුකර ඇති අතර, 2022 වර්ෂයේදී පොල් සංවර්ධන අධිකාරිය විසින් මෙම සමාගම අසාදු ලේඛනගත කර ඇත. ඒ | නීතිමය කටයුතු නිසි පරිදි මෙහෙයවා ලැබිය යුතු මුදල් අයකර ගැනීමට මණ්ඩලය නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| මුදලක් අයවිය යුතු ඩබ්ලිව්. ටී. වාස් සහ සමාගම සොයාගත නොහැකි බව දන්වා 2017 වර්ෂයේදී නීතිපති දෙපාර්තමේන්තුව විසින් නඩුව අවසන් කර තිබුණු නමුත් එම සමාගම 2020 වර්ෂයේ තැරැව්කාර සමාගමක් ලෙස පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී පොල් වෙන්දේසි සඳහා සහභාගී වන බවද නිරීක්ෂණය විය. | අනුව මෙම සමාගමට මෙවැනි වංචනික කටයුතු ඉදිරියටත් සිදුකිරීමට නොහැකි වන ලෙස මෙම සමාගම අසාදු ලේඛනගත කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දන්වා සමාගම් රෙජිස්ටාර්වරයා ද දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වසර 02 ත් 07 ත් අතර කාලයක සිට නිරවුල් නොවී පැවති ඉදිකිරීම් කාර්යයන් 42කට අදාළ රඳවාගත් මුදල් රු.6,565,730ක් අදාළ කාර්යයන් පිළිබඳ ඇගයීමක් කර නිරවුල් කර ගැනීමට කටයුතු නොකර වෙළෙඳ ණයහිමියන් යටතේ දක්වා තිබුණි. | නිරවුල් නොවී ඇති ඉදිකිරීම් කාර්යයන්ට අදාළ වසර දෙකකට වඩා වැඩි ශේෂයන් පෙර වර්ෂයේ ආදායමට ගළපා නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | ඉදිකිරීම් කාර්යයන්ට අදාළව රඳවාගත් මුදල් ගෙවීමට හෝ ආදායම් ලෙස ගිණුම් ගත කිරීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |
| (ආ) ගබඩාකරු හා මුදල් අයකැමි වශයෙන් සේවය කර දැනට සේවයෙන් ඉවත් වී ඇති සේවකයින් 08 දෙනෙකුගෙන් 1979 සිට 1992 දක්වා කාලපරිච්ඡේදයක් තුළ ලබාගෙන ඇති එකතුව රු.603,818 ක තැන්පතු ශේෂයන් සඳහා වසර 29 සිට වසර 42 දක්වා කාලයක් ගත වූවද මේ දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | දැනට සේවයෙන් ඉවත් වී ඇති සේවකයින් 8 දෙනෙකුගෙන් 1979 සිට 1992 දක්වා කාල පරිච්ඡේදය තුල ලබාගෙන ඇති එකතුව රු.603,818ක තැන්පතු ශේෂයන් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු කරනු ඇත. | දැනට සේවයෙන් ඉවත් වී ඇති නිලධාරීන්ට අදාළ කටයුතු කඩිනම් නිරවුල් කිරීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) විවිධ ණයහිමියන් යටතේ දක්වා තිබුණු නිලධාරින් 11කට අදාළ රු.671,228 ක 2020 වර්ෂයේ නොගෙවූ වැටුප් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද , ගෙවීම් කර නොතිබුණි. | 2020 වර්ෂයට අදාළව ණයහිමියන් යටතේ දක්වා තිබූ නිලධාරින් 11කට අදාළ නොගෙවූ වැටුප් ආදායමට ගළපා මූල්‍ය ප්‍රකාශන වලින් ලියා හැරීමට කටයුතු කරනු ඇත. | නොගෙවූ වැටුප් පිළිබඳ සොයා බලා අදාළ ගනුදෙනු නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනතේ 12 (2) උප වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සකස් කර 2009 ඔක්තෝම්බර් 14 | රෝගී ගසක් ලෙස සලකුණු කළ දිනයේ සිට දින 14ක් ඇතුළත එම ගස් කපා ඉවත් කිරීම හා නියෝග කරනු ලබන ආකාරයට ක්‍රියා කිරීම | 2020 සහ 2021 වර්ෂ වලදී ඇති වූ කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ක්ෂේත්‍ර නිලධාරීන්ට ඉඩම් වෙත ගොස් එන්නත් කිරීමට අපහසු වීම නිසා 2021.12.31 දින වන විටදී රෝගී ගස් 13,484ක් ක්ෂේත්‍රය තුළ | හඳුනාගෙන ඇති රෝගී පොල් ගස් 13,484 වහාම විනාශ කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | දිනැති අංක 1623/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරනු ලැබ ඇති නියෝග මාලාවේ 4 වන වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ සභාපති විසින් නිකුත් කර ඇති විධාන | කළයුතු වුවද වැලිගම පොල් කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගයට ගොදුරු වූ ගස් ලෙස හඳුනාගෙන මණ්ඩලය සලකුණු කළ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඉඩම් හිමිකරුවන් හෝ මණ්ඩලය විසින් කපා ඉවත් නොකළ පොල් ගස් ප්‍රමාණය 13,484 ක් විය. | ඉතිරි විය. එනමුත් , මෙම රෝගී ගස් ප්‍රමාණය ද ඇතුළුව 2022 වර්ෂයේදී දෙසැම්බර් 31 දිනට රෝගී ගස් 18,650ක් ඉවත් කර ඇත. | |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2022 දෙසැම්බර් 02 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | ඉදිරියේදී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන ලබාදීමට කටයුතු කරනු ඇත. | කෙටුම්පත් වාර්ෂික වාර්තාව සමඟ මූල්‍ය ප්‍රකාශන යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂය අවසාන වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | 2014 මාර්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි පනවා ඇති පොල් සංවර්ධන අධිකාරියේ පොල් වෙන්දේසි නීතිමාලාව (i) 21 (අ), (ආ), (ඇ) සහ 22 (ඇ) නීතිය | පොල් වෙන්දේසියේදී පොල් තොග මිලදී ගැනීමෙන් දින 14 ක් ඇතුළත සියයට 25 ක් ද , දින 35 ක් ඇතුළත සියයට 75 ක් ද වශයෙන් ගැනුම්කරු විසින් මුළු මුදලම ගෙවිය යුතු අතර එසේ නොවූ විට ප්‍රමාද ගාස්තුවක් සහ සියයට 20ක බිම් කුලිය සඳහා ගෙවිය යුතු දඩ මුදලක් ද අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවද, විකුණුම් සඳහා ඉන්වොයිසියක් නිකුත් නොකරන බැවින් අදාළ දඩ මුදල් හා ප්‍රමාද ගාස්තු | 2021 වර්ෂයට අදාළව පොල් සංවර්ධන අධිකාරියේ වෙන්දේසියේ අලෙවි කළ සියලුම පොල් තොග සඳහා ඊට අදාළ සියලුම දඩ මුදල් අයකරගෙන ඉතිරි මුදල් ඇත්නම් බ්‍රෝකර් සමාගම් වෙත ලිඛිත අනුමැතිය සහිතව චෙක්පත් මඟින් ගෙවීම්කර ඇත. | සියලුම විකුණුම් සඳහා විධිමත් ඉන්වොයිසියක් නිකුත් කළ යුතු අතර ගැනුම්කරුවන්ගෙන් නිසි පරිදි මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

නියමාකාරයෙන් අයකරගත් බවට විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 611,133,769 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.131,470,029 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.479,633,740 ක වර්ධනයක් නිරීක්ෂණය විය.සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයෙන් පිළිවෙලින් රු.259,000,000 ක් හා රු.100,000,000ක් වාරිමාර්ග ව්‍යාපෘතියකට හා පොල් ඉඩම් සංවර්ධන ව්‍යාපෘතියට ලැබී තිබීමත් තවාන් ලාභය, ආදර්ශ පොල් උයන් ලාභය හා කප්රුක ව්‍යාපෘති ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.124,650,158කින් රු.200,549,822 කින් හා රු.38,129,208 කින් ඉහළ යාමත් මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේදී ජංගම වත්කම් හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 4 : 1 ක් සහ 2 : 1 ක් විය. අවසාන තොගය හා මුදල් හා මුදල් සමාන දෑවල එකතුව 2021 වර්ෂයේදී රු.1,295,399,307ක්ද 2020 වර්ෂයේදී රු.599,525,262 ක්ද වශයෙන් අධි කාරක ප්‍රාග්ධන තත්ත්වයක් හේතුවෙන් ජංගම හා ක්ෂණික වත්කම් අනුපාත ඉහළ අගයක් ගෙන තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පොල් වගාකළ හැකි ඉඩම් තෝරා ගෙන ඒවායේ පොල් වගාව අලුතින් ආරම්භ කර එම ඉඩම් වාණිජ පොල් ඉඩම් බවට පත් කිරීම හා දැනට පවතින පොල් ඉඩම් ප්‍රමාණය වැඩි කිරීමටත්, එමගින් පොල් ඵලදාව වැඩිකර ගැනිමේ අරමුණින් පුරන් කුඹුරු අක්කර 2500ක් ඵලදායී වාණිජ ඒකක බවට පත් කිරීම සඳහා 2021 වර්ෂයේදී රාජ්‍ය අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රු.100,000,000 ක මුදලක් මණ්ඩලයට වෙන් කර පසුව අක්කර 380 ක එම කටයුතු කිරීමට අනුමත කරගෙන තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අක්කර 03 ක රජයේ ඉඩම්ද අක්කර 27.5 ක පෞද්ගලික ඉඩම්ද වශයෙන් අපේක්ෂිත ප්‍රමාණයෙන් සියයට 8ක ප්‍රගතියක් පමණක් මණ්ඩලය විසින් ළඟාකරගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය මගින් ගොවීන්ට පොල් පැළ හා අක්කරයකට රු.80,000 ක මුදල් සහනාධාර ලබා දීමට අපේක්ෂා කළද මෙම කාර්යය සිදුකිරීමටද මණ්ඩලයට නොහැකි වී තිබුණි. | කුඹුරු ඉඩම්වල පොල් වගාව වැනි බහු වාර්ෂික බෝග වගාකිරීම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම අත්‍යාවශ්‍ය වූ බැවින් ඉල්ලුම්පත් සියල්ල ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි. 2021 වසර තුළ අක්කර 3.25 ප්‍රමාණයක් සඳහා පමණක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබුණි. ඉතිරි ප්‍රමාණය සඳහා අනුමැතිය නොලැබුණු බැවින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. | නිසි සැලසුම් ගත ඉලක්කයන් සහිතව දැනට පවතින පොල් ඉඩම් ප්‍රමාණය වැඩිකර ගැනීමට ගොවීන් උනන්දු කර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් සහිතව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) මාතර, ගාල්ල හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක 03හි කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගී කලාපයන්හි 2008 සිට 2021 දක්වා කාලපරිච්ඡේදය තුළ රෝගී පොල් ගස් 332,075 ක් හඳුනාගෙන ඉන් ගස් 309,622 ක් ඉවත් කර තිබුණු අතර ගස් 285,715 ක් සඳහා රු.610,275,180 ක් වන්දි මුදල් ලෙස ලබා දී තිබුණි.මෙම රෝගය හඳුනාගෙන අවුරුදු 14ක් ගතවී තිබුණද , දකුණු පළාත තුළින් මෙම රෝගය මර්ධනය කිරීමට හෝ පාලනය කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද නොහැකි වී තිබුණු අතර, රෝගී කලාපය තුළ රෝගී ලක්ෂණ පෙන්වන පොල්ගස් හා පැළ කපා ඉවත් කිරීම පමණක් සිදු වී ඇති බව නිරීක්ෂණය විය. | මෙම රෝගය පාලනය කිරීම සඳහා එකම විසඳුම ලෙස, රෝගී කලාපය තුළ රෝග ලක්ෂණ පෙන්නුම් කරන සියලුම පොල් ගස් හා පැළ කපා ඉවත් කිරීම බව පොල් පර්යේෂණ ආයතන විසින් නිර්දේශ ලෙස ඉදිරිපත් කර ඇත. 2021 වර්ෂයේ පැවති කොවිඩ් තත්ත්වය හමුවේ වර්ෂය ආරම්භයේදී සැලසුම් කළ පරිදි ක්ෂේත්‍ර කටයුතු සිදු කිරීමට අපහසු වී ඇත. | රෝගය පාලනය කිරීමට ස්ථිර ප්‍රතිකාරයක් හඳුන්වා දිය යුතුය. |
| (ඇ) 2021 ක්‍රියාකාරී සැලැස්ම අනුව වැලිගම පොල් ගස් කුණුවීම හා මැලවීමේ රෝග මර්ධන ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය තුළදී රෝගී කලාපය ලෙස හඳුනාගෙන තිබුණු මාතර, ගාල්ල, හම්බන්තොට දිස්ත්‍රික්ක තුනෙහි ග්‍රාම නිලධාරි වසම් 408 ක ඉඩම් පරීක්ෂා කර රෝගී ගස් හඳුනාගෙන සලකුණු කිරීමට ඉලක්ක කර තිබුණු අතර ඒ වෙනුවෙන් රු.15,640,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. එසේ වුවද දිස්ත්‍රික තුනෙහි ග්‍රාම නිලධාරි වසම් 257ක ඉඩම් පරීක්ෂා කර රෝගී ගස් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේදී රෝගී කලාපයට අයත් ග්‍රාම නිලධාරි වසම් 408ට අයත් ඉඩම් පරීක්ෂා කිරීමට සැලසුම් කරන ලදි. එනමුත් , මෙම වර්ෂයේ පැවති කොවිඩ් තත්ත්වය හේතුවෙන් ක්ෂේත්‍ර නිලධාරීන් හට ඉඩම් වෙත ප්‍රවේශවීමේ හැකියාවක් නොලැබුණි. එමෙන්ම, ක්ෂේත්‍ර නිලධාරීන් ක්ෂේත්‍ර රාජකාරීවල නිරතවීමද මෙම වර්ෂය තුළදී සීමාසහිත වී ඇත. | රෝගී ගස් හඳුනාගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) 2019 වර්ෂයේදී කෑගල්ල හා ගම්පහ දිස්ත්‍රික්ක ආශ්‍රිතව පොල් වගාවට “සුදු මැස්සා” පළිබෝධකයාගෙන් සිදුවන ග්‍රහනය 2020 වර්ෂයේදී වැඩිවී ගම්පහ, කොළඹ හා කළුතර දිස්ත්‍රික්කවල සුදුමැස්සාගේ ඉහළ ගහන ඝනත්වයක් දක්නට ලැබුණු අතර , මේ වන විට ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය කාර්යාල 13ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 132 ක් දක්වා ව්‍යාප්ත වී තිබුණ ද, හානිය පාලනය සඳහා ප්‍රමාණවත් තරම් දියර ඉසින යන්ත්‍ර නොමැති වීම හා ග්‍රීස් ආලේප කිරීම උසින් වැඩි පොල් ගස් සඳහා ප්‍රායෝගිකව සිදුකිරිමට අපහසුවීම වැනි හේතූන් මත රෝගය මර්ධනය කිරීමට නොහැකි වී තිබුණි. | මෙම හානිය හඳුනාගත් අවස්ථාවේදීම පොල් පර්යේෂණ ආයතනය විසින් ලබාදුන් නිර්දේශ ක්ෂේත්‍ර මට්ටමින් ආරම්භ කරන ලදි. එමෙන්ම, අප ආයතනයට අයත් සියලුම ක්ෂේත්‍ර නිලධාරින් විසින් මෙම හානිය වාර්තා වූ ප්‍රදේශ වල සිටින වගාකරුවන් දැනුවත් කිරීම නිරන්තරයෙන් සිදු කරන ලදි. මේ වන විටදී මෙම හානිය මර්ධන කාර්යයන් සාර්ථකව ක්ෂේත්‍ර මට්ටමින් සිදු කරමින් පවතී. | සුදු මැස්සා රෝග පාලනය හා රෝග මර්ධනය සඳහා තිරසාර ප්‍රතිකාරයක් සොයාගත යුතුය. |
| (ඉ) තැඹිලි වගාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය විසින් පොල් වගාකිරීමේ මණ්ඩලය වෙත 2020 වර්ෂයේ දී | තැඹිලි ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා වෙන් වී ඇති රු.මි.25ක ප්‍රතිපාදන 2023 | තැඹිලි වගාව ප්‍රවර්ධනය කිරීමට ලැබූ අරමුදල් එම ව්‍යාපෘති සාර්ථක |

| | | |
|---|---|---|
| ලබාදුන් රු.මිලියන 25 ක් අදාළ කාර්ය වෙනුවෙන් නොයොදා සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. | වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම යටතේ යොදාගැනීමට සැලසුම් කර ඇත. | කර ගැනීමට යෙදවිය යුතුය. |
| (ඊ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ පොල් පර්යේෂණ ආයතනය සතු මඩකලපුව, කුරුණෑගල, අම්පාර, යාපනය වැනි දිස්ත්‍රික්කවල පිහිටි ඉඩම් වල පොල් උයන් 9ක් වසර 50 කට ආසන්න කාලයක සිට පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් පවත්වාගෙන ගියද මෙම ඉඩම් විධිමත් පරිදි පවරා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය තෙක් මණ්ඩලයට නොහැකිවී තිබුණි. | 2016 වර්ෂයේදී ඉඩම් 5ක් සඳහා මැනුම් කටයුතු සිදුකර පිඹුරුපත් ඉඩමේ ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ලබා දී ඇත. එයින් ඉඩම් 4ක රු.මි.418ක තක්සේරු වටිනාකම් ලබා දී ඇත. මේ පිළිබඳව 2022 හා 2023 වර්ෂවල මණ්ඩලය දැනුවත් කිරීම් සිදුකර ඇත. | මණ්ඩලය විසින් පරිහරණය කරනු ලබන ඉඩම් විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) සමාලෝචිත වර්ෂයේදී රෝගී ගස් විනාශ කිරීම සඳහා ගස් 4,800ක් එන්නත් කිරීමට සැලසුම් කළද වර්ෂය අවසානය වන විට රෝගී ගස් 571ක් පමණක් එන්නත් කර තිබුණු බැවින් අපේක්ෂිත පරිදි රෝගී ගස් 4,229 ක් එන්නත් කිරීමට නොහැකි වී තිබුණි. | රෝගී කලාපය තුළ හඳුනා ගන්නා රෝගී ගස් වගාකරුවන් ක්ෂේත්‍රයෙන් ඉවත් නොකළ අවස්ථා වලදී ඉවත් කිරීමට ග්ලයිෆොසෙට් රසායනිකය එන්නත් කරනු ලැබේ. එම රසායනිකය රජයෙන් ආනයනය තහනම් කිරීම නිසා සැලසුම් කළ පරිදි කටයුතු කළ නොහැකි වී ඇත. | රෝගී ගස් ඉවත් කර රෝග මර්ධනය කඩිනම් කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රෝගී කලාපය පිහිටි දිස්ත්‍රික්ක තුනෙහි රෝගී ගස් කපා දැමූ ඉඩම් හිමියන්ගේ ජීවන තත්ත්වය නඟාසිටුවීම සඳහා කොළ කුන්දිරා හා වැලිගම රෝගයට ඔරොත්තු දෙන ප්‍රතිරෝධී පොල් පැළ සිටුවීම අපේක්ෂා කර තිබුණු නමුත් රෝගය ආරම්භ වූ 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කපා ඉවත් කරන ලද පොල්ගස් සංඛ්‍යාව ආසන්න වශයෙන් 309,622 ක් වුවද එයට සාපේක්ෂව අලුතින් ලබාදුන් ප්‍රතිරෝධී පොල් පැළ සංඛ්‍යාව 88,478ක් හෙවත් සියයට 28ක් වැනි අඩු ප්‍රතිශතයක් වූ අතර 2020,2021 හා 2022 වර්ෂවලදී ප්‍රතිරෝධී පැළ කිසිවක් ලබාදී නොතිබුණි. | කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගයට ප්‍රතිරෝධී ප්‍රභේදයක් ලෙස කොළ කුන්දිරා ප්‍රභේදය පොල් පර්යේෂණ ආයතනය නිර්දේශ නිකුත් කර ඇත. මේවා වගාකරුවන් වෙත ලබා දුන්නද පොල් ගෙඩි අස්වැන්න කුඩා වීම, පොල් මදය තුනී වීම වගාකරුවන්ගේ උනන්දුව අඩුවීම හේතුවෙන් පොල් බීජ මණ්ඩලය විසින් ලබා දී නැත. | ඉවත් කරන පොල් ගස් වෙනුවට රෝගයට ඔරොත්තු දෙන ප්‍රතිරෝධී පැළ ලබා දීම තුළින් ඉඩම් හිමියන්ගේ ජීවන මට්ටම යථා තත්ත්වයට පත්කළ යුතුය. |
| (ආ) පොල් වගාකිරීමේ මණ්ඩලය හා පොල් පර්යේෂණ ආයතනයේ ගිවිසුම් ප්‍රකාරව මණ්ඩලයේ පවතින පැළ තවාන ප්‍රතිරෝධී නව දෙමුහුම් බීජ පැළ තවානක් බවට පුළුල් | පොල් පැළ නිෂ්පාදනය කිරීමේ කාර්යයෙහි වගකීම පොල් පර්යේෂණ ආයතනය සතුව පවතී . | ගිවිසුම් ප්‍රකාර දෙපාර්ශවය විසින්ම සැලසුම් කළ ආකාරයට ප්‍රතිරෝධී දෙමුහුන් බීජ |

| | | |
|---|---|---|
| කිරීම කළ යුතු වුවද විගණිත දින වන විට අවුරුදු 06ක් ගත වී තිබුණද වැලිගම ස්ථාපිතකර ඇති බීජ උයනේ එවැනි ප්‍රතිරෝධී දෙමුහුම් බීජ පැළ 3193ක් වැනි සුළු සංඛ්‍යාවක් පමණක් නිෂ්පාදනය කර බෙදා හැර තිබුණි. | | පැළ උද්‍යානය ස්ථාපිත කළ යුතුය. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී ණය ලබාදීම යටතේ පොල් ඉඩම් අක්කර 1,122 ක වාරිමාර්ග පද්ධති ස්ථාපිත කිරීමට රු.59,610,000 ක මුදලක් වෙන් කර තිබුණද අපේක්ෂිත පරිදි සැලසුම්කළ ප්‍රාදේශීය කාර්යාල 15ක අක්කර 508 ක වාරිමාර්ග පද්ධති ස්ථාපිත කර නොතිබුණි. | ණය වැඩසටහන යටතේ ජලසම්පාදන පද්ධති ස්ථාපිත කිරීමේ භෞතික ප්‍රගතිය 61%ක අගයක් වීමට ප්‍රධාන හේතුව වූයේ 2021 වසරේ රට තුළ පැවති කොවිඩ් වසංගත රෝගී තත්ත්වයි. මෙම වසංගත තත්ත්වය යටතේ රජයේ කාර්යාල බැංකු පද්ධති මෙන්ම වගාකරුවන් ණය ලබා ගැනීමට මැලිකමක් දැක්වීම නිසා ආරම්භයේදී සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක වී නොමැත. | යෝජිත වාරිමාර්ග පද්ධති නොපමාව සම්පූර්ණ කරවා ගත යුතුය. |
| (ආ) මණ්ඩලයේ නිලධාරීන්ගේ හා සේවකයින්ගේ අර්ථසාධක අරමුදල් මණ්ඩලය තුළ වෙනම අරමුදලක් ලෙස පවත්වාගෙන යන අතර, අර්ථසාධක අරමුදලේ රාජකාරි කළ නිලධාරින් හතරදෙනෙකු විසින් 2015 – 2021 අතර කාලය තුළ අරමුදලේ චෙක්පත් 50 ක් තමන්ගේ නමින් හා ඥාතීන්ගේ නමින් ලියා රු.73,839,369 ක මුදල් වංචා කර තිබුණු බව පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය විශේෂ විමර්ෂණයක් මඟින් අනාවරණය කරගෙන තිබුණි. අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත නොකිරීම, අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබීම, ගිණුම් පොත් පත් හා ලේඛන යාවත්කාලීන කර නොතිබීම , මූල්‍ය පාලන බලතල පැවරීමකින් තොරව නිලධාරීන්ට වසර ගණනාවක් අරමුදලේ එකම කාර්යයක් සිදුකිරීමට ඉඩකඩ සලසා දී තිබීම හා අරමුදලේ කටයුතු කම්කරු කොමසාරිස්ගේ අවධානයට යොමුකර | 2015-2021 අතර කාලසීමාවේ අර්ථසාධක අරමුදලට අනුයුක්තව සේවය කළ ලේකම්වරිය හා කළමනාකරණ සහකාරවරිය හා ඔවුන්ගේ ඥාතීන් රු.73,839,369ක මුදලක් වංචාකර තිබුණු අතර මේ වන විට ඒ සඳහා නිවැරදි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපනය කර ඇත. | අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම, අභ්‍යන්තර විගණනයක් සිදු කිරීම, ගිණුම් පොත් පත් හා ලේඛන යාවත්කාලීන කිරීම මූල්‍ය පාලන බලතල පැවරීමට අරමුදලේ කටයුතු කම්කරු කොමසාරිස්ගේ අවධානයට යොමු කිරීම, වංචා කළ මුදල් අයකර ගැනීමට හැකිවන පරිදි නොපමාව නඩු කටයුතු මෙහෙයවීම සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| නොතිබීම යනාදී කරුණු අනුව අරමුදලේ පාලක සභාව සිය වගකීම නිසි ලෙස ඉටුකර නොතිබීම මෙම වංචාවට හේතු වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. වංචා කළ<br><br>මුදලින් රු.3,790,050ක් අරමුදලේ සේවය කළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දී අයකරගෙන තිබීම හා නිලධාරීන් හතර දෙනෙකුගෙන් තිදෙනෙකු සේවයෙන් පහ කර ඇති අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බී/4515/21 අංක යටතේ කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඔවුන් තිදෙනා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. තවත් එක් නිලධාරියෙකු වෙනුවෙන් විනය පරීක්ෂණය අවසන් කිරීම පමණක් සිදුකර තිබුණි. | | |
| (ඇ) පොල් වගා කිරීමේ මණ්ඩලයට ද්විතික පදනම මත අනුයුක්ත කර තිබුණු සාමාන්‍යාධිකාරීවරියට ලබා දුන් කුලී නිවසට 2021 වර්ෂයේ දී රු.420,000 ක් සහ එම නිවසට පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ලී බඩු මිලදී ගැනීමට මණ්ඩලය විසින් රු.372,149 ක් වියදම් කර තිබුණි. 2020 ජනවාරි 05 දිනැති අංක PED/A/CCB/1/2 (i) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව සාමාන්‍යාධිකාරී තනතුර ප්‍රධාන කාර්යාලයට සීමා වූ තනතුරක් බැවින් නිල නිවාස සැපයීමේ හෝ පාරිභෝජ්‍ය භාණ්ඩ ලබා ගැනීමේ අවශ්‍යතාවයක් නොමැති බවත් අමාත්‍යාංශ ලේකම්ගේ 2022 පෙබරවාරි 22 දිනැති අංක SMCKP/IA/CCB දරන ලිපිය අනුව මෙම කාරණය මත පොල් වගා කිරීමේ මණ්ඩලයට සිදු වී ඇති අලාභය සාමාන්‍යාධිකාරීගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතු බව දන්වා තිබුණද, හිටපු සාමාන්‍යාධිකාරීගෙන් රු.7,200 ක මුදලක් පමණක් අයකර නිලධාරිනිය 2021 දෙසැම්බර් 20 දින සේවයෙන් මුදාහැර තිබුණි. | ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව වෙත ලිපියක් යොමු කරමින් අදාළ මුදල් අයකරගෙන එවීමට කටයුතු කරන මෙන් දැනුම් දී ඇත. ඒ අනුව එහි ප්‍රගතිය පිළිබඳව අප විසින් රේඛීය අමාත්‍යාංශයෙන් විමසා ඇතත් මේ වන තෙක් එම කටයුතුවල ප්‍රගතිය පිළිබඳව විස්තර අප වෙත ලැබී නොමැත. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියට අනුව සාමාන්‍යාධිකාරි තනතුර ප්‍රධාන කාර්යාලයට සීමා වූ තනතුරක් බැවින් ගෙවූ බදුකුලී හා ලී බඩු සඳහා මණ්ඩලය දැරූ වියදම් අදාළ නිලධාරියාගෙන් හෝ එම ගෙවීම අනුමත කළ, බලය දුන් හෝ සහතික කළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) 2003 ජූනි 02 දිනැති අංක පී.ඊ.ඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.8.2 ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව මණ්ඩලයේ සභාපති සහ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් ඇතුළුව නිලධාරීන් 27 දෙනෙක් සඳහා 2011 නොවැම්බර් මස සිට 2015 ජනවාරි මස දක්වා රු.17,186,549ක කම්කරු | කම්කරු දීමනාව අයකර ගැනීමට විරෝධය දක්වමින් අදාළ නිලධාරීන් විසින් රිට් ආඥාවක් ලබා ගැනීම සඳහා අභියාචනාධිකරණයේ පෙත්සමක් ගොනු කර ඇති බව දන්වා ඇත. | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ලබාගත් කම්කරු දීමනාව තවදුරටත් ප්‍රමාද නොකර අදාළ නිලධාරීන්ගෙන් අයකර ගත යුතු අතර එම දීමනා |

| | | |
|---|---|---|
| දීමනාවක් මුදලින් ගෙවා තිබුණි. මෙමගින් මණ්ඩලයට සිදුවූ අලාභය මේ දක්වා අදාළ නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | ගෙවීමට සහතික කළ හා අනුමත කළ නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.4 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2011 හා 2017 වර්ෂ වලදී නළ ළිං ව්‍යාපෘතිය සඳහා ලැබී ඉතිරි වූ රු.236,324 ක් ද පොහොර සහනාධාර ව්‍යාපෘතිය සඳහා ලැබී ඉතිරි වූ රු.568,452 ක් ද වශයෙන් රේඛීය අමාත්‍යාංශයෙන් ලැබූ එකතුව රු.798,776 ක් අභාවිතව බැංකු ගිණුම්වල පැවතුණි. | ඌන උපයෝජිතව පැවති ගිණුම්වල පැවති ශේෂයන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ වසා දැමීමට කටයුතු කර ඇත. | අදාළ මුදල් ආපසු ලබාගෙන අක්‍රීය බැංකු ගිණුම් වසා දැමිය යුතුය. |

**3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 වර්ෂයේ අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ පොල් ඉඩම්වල වාරිමාර්ග පද්ධති පිහිටුවීම හා මයිටා මර්ධන ව්‍යාපෘතිය යන ව්‍යාපෘති 02ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 269.35ක් පොල් වගාකිරීමේ මණ්ඩලයට ලැබී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය වන විට වැයකළ මුදල රු.මිලියන 257.09ක් වූ බැවින් රු. මිලියන 12.26ක් හෙවත් සියයට 4.5ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි | 2021 වර්ෂයේ අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 2 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබුණු රු.මි.269.35 න් ඉතිරි මුදල් 2022 වර්ෂයේදී ගෙවා අවසන් කර ඇත. | රජයෙන් ලැබෙන අරමුදල් නිසි සැලසුමකින් යුතුව ව්‍යාපෘති තුළ යොදවා ඒවා ඵලදායී ව්‍යාපෘති ලෙස සාර්ථක කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2021 වර්ෂයේ දී අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රු.50,360,000 ක මුදලක් මණ්ඩලයට වෙන් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.17,720,000 ක් පමණක් වියදම් කර තිබුණු බැවින් අනුමත ප්‍රතිපාදනයෙන් රු.32,640,000 ක් හෙවත් සියයට 65ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | 2021 වර්ෂයේදී මෙම ව්‍යාපෘතියට වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් අදාළ කාර්යයන් සිදු කිරීමට සැලසුම් කරන ලදි. එනමුත් මෙම වර්ෂයේ පැවති කොවිඩ් තත්ත්වය හමුවේ ක්ෂේත්‍ර නිලධාරීන්ට ක්ෂේත්‍රය වෙත ගොස් ගස් සලකුණු කිරීම, ඉවත් කිරීම, එන්නත්කරණය වැනි මූලික ක්‍රියාකාරකම් පෙර වර්ෂවල මෙන් සිදු කිරීමට නොහැකි විය. | රජයෙන් ලැබෙන ප්‍රතිපාදන නිසි සැලකිල්ලෙන් යුතුව කළමනාකරණය කර ව්‍යාපෘති සාර්ථක කර ගත යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2012 වර්ෂයේදී අනුරාධපුර කටුකැලියාවේ සංචාරක බංගලාවේ ඉදිකිරීම් පෞද්ගලික කොන්ත්‍රාත් ආයතනයක් මගින් සිදුකර තිබුණු අතර කොන්ත්‍රාත් පිරිවැය රු.11,809,918 ක් විය. ඉදිකිරීම් අවසන් කර වසර 04 ක් වැනි කෙටිකාලයක් ඇතුළත ගොඩනැගිල්ලේ පහත මාලයේ ඉරිතැලීම් 22 ක්, පහත මහලයේ කාමරයක් තුළ ටයිල්ද සමඟ බිත්ති පිපිරීම් හා උඩුමහලේ ඉරිතැලීම් 06 ක් ද ඇති වී හානිදායක මෙන්ම අවධානම් තත්ත්වයකට පත් වී තිබුණු අතර ගොඩනැගිල්ලේ අත්තිවාරම සැලසුම් කිරීමේදී එම භූමියේ පවතින පසෙහි ස්වභාවය හා භූගත ජල මට්ටම ගැන සැළකිලිමත් වී නොමැති වීම ද, ඉදිකිරීම් නිසි ප්‍රමිතියකට සිදු වී නොමැති වීමද මෙම තත්වයට හේතුවී තිබුණු බව විගණනයේදී නිරික්ෂණය විය. | අනුරාධපුර කටුකැලියාවේ සංචාරක නිවාසයේ ඉදිකිරීම් කටයුතු 2012 වර්ෂයේ සිදුකර ඇති අතර පසුගිය වසර 04 ක කාල සීමාව තුල බිත්තිවල ඉරිතැලීම් සිදු වී ඇත. නමුත් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් ලබාදුන් තාක්ෂණික වාර්තාවේ එම ඉරිතැලීම් අවදානම් තත්ත්වයක නොපවතින බව සඳහන් කර ඇත. | නිවැරදි ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කරමින් ඉදිකිරීම් නිසි පරිදි සිදුකර ගැනීමට කටයුතු කළ යුතු අතර එසේ කටයුතු නොකළ වගකිවයුතු නිලධාරින් හඳුනාගෙන එම නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) 2021 මැයි 17 දින පොල් වගාකිරීමේ මණ්ඩලයේ සංචාරක බංගලා ගොඩනැගිල්ලේ ඇති වී තිබූ ඉරිතැලීම් හා පලුදුවීම් සම්බන්ධව ගොඩනැගිල්ල පරීක්ෂාකර තක්සේරු වාර්තාවක් ලබාදෙන මෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් ඉල්ලා තිබුණු අතර ඒ අනුව එම ආයතනය විසින් 2022 ජනවාරි 04 දින එම ස්ථානයේ ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කිරීමෙන් අනතුරුව ගෘහ නිර්මාණ සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම්, පාංශු පරීක්ෂණ වාර්තා හා වෙනත් අදාළ ලිපිලේඛන ලබාදෙන ලෙස මණ්ඩලයෙන් ඉල්ලුම් කළද, පාංශු පරීක්ෂණ වාර්තා මණ්ඩලය විසින් ඉදිරිපත් කර නොතිබුණු බැවින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් පාංශු පරීක්ෂණ වාර්තා පරීක්ෂාවෙන් තොරව 2022 සැප්තැම්බර් 16 දින අවසන් වාර්තාව නිකුත් කර තිබුණි. | අනුරාධපුර කටුකැලියාව සංචාරක නිවාසය සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයයේ වාර්තාව නිකුත් කිරීමට අදාළව ඉල්ලා සිටින ලද ගෘහ නිර්මාණ සැලසුම්,ව්‍යුහාත්මක සැලසුම් හා අදාළ වෙනත් ලියවිලි අප විසින් ලබා දී ඇති අතර පාංශු පරීක්ෂණ වාර්තාව සම්බන්ධයෙන් තොරතුරු නොමැත. | ගොඩනැගිලි ඉදිකිරීමේදී ශක්‍යතා අධ්‍යයනයකින් පසුව පාරිසරික සහතික ලබා ගෙන නිසි සැලසුම්ගත වැඩ පිළිවෙලක් යටතේ ප්‍රතිපාදන කාර්යක්ෂමතාව උපයෝගී කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2022 වර්ෂයේදී මණ්ඩලය විසින් අනුරාධපුර සංචාරක බංගලා ගොඩනැගිල්ලේ අලුත්වැඩියාව කටයුතු සිදුකිරීම සඳහා තක්සේරු වාර්තාවක් සහ රු.3,999,800 ක අලුත්වැඩියා ඇස්තමේන්තුවක් ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ සංවිධානයෙන් | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් නිකුත් කර ඇති තාක්ෂණික වාර්තාව හා ඇස්තමේන්තුව 2022.09.27 දින මණ්ඩලය වෙත ලැබී ඇත. ඒ අනුව මෙම සංචාරක නිවාසය | ගොඩනැගිලි ඉදිකිරීමේදී ඒ සඳහා අවශ්‍යවන සියළුම වාර්තා ලබා ගෙන නිසි සැලසුම්සහගත වැඩ පිළිවෙලක් යටතේ |

| | | |
|---|---|---|
| ලබා ගෙන තිබුණු නමුත් මේ දක්වා අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට ආයතනයට නොහැකි වී තිබුණි. | අලුත්වැඩියා කිරීම පිළිබඳ ඉදිරි කටයුතු සඳහා තාක්ෂණික වාර්තාවේ හා ඇස්තමේන්තුවේ පිටපත් ආදර්ශ පොල් උයන් අංශය වෙත යොමුකර ඇත. | ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝගී කර ගනිමින් ඉදිකිරීම් කල යුතුය. |

**3.7 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ).මණ්ඩලයේ ප්‍රධාන තනතුරු 3ක් වූ සාමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය කළමනාකරණ) හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ව්‍යාප්ති හා සංවර්ධන) යන තනතුරු සමාලෝචිත වර්ෂයේ අවසානයට පුරප්පාඩුව පැවතුණි. යථෝක්ත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි තනතුරු දෙක 2020 වර්ෂයේ දී ද පුරප්පාඩුව පැවතුන ද , සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි 2023.01.17 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබ 2023.04.03 දිනැතිව ප්‍රධාන පුවත්පත් වල ප්‍රසිද්ධ කරමින් සාමාන්‍යාධිකාරි සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ව්‍යාප්ති හා සංවර්ධන) යන තනතුරු 2ක සඳහා බාහිරින් සහ අභ්‍යන්තර අයදුම්පත් කැඳවා බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. | බඳවාගැනීමේ කටයුතු කඩිනම් කරගත යුතුය. |